## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 මාර්තු මස 03 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015-02-18 දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර/VI (1) /15/01)

අ) බස්නාහිර පළාතේ කොළඹ දිසිත්‍රික්කයේ පළාත් පාසල් වල 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කරගනු ලැබුවේද?

ආ) එම ඇතුලත් කිරීම්වලට අනුව පාසලක හඳුනාගැනීම සඳහා යොදා ඇති පන්තිවල නම් සහිතව එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන හා ඒ ඒ පන්තියේ සම්පුර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන කොපමණදා

ඇ) පුරප්පාඩු සඳහා ක්‍රියාන්විත රාජකාරියේ සිටින පවුල්වල ළමුන් ලෙස අයදුම් කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන ඒ ඒ පාසලට අනුව කීයද?

ඈ) ඒ අනුව ඒ ඒ පන්තිවලට ඇතුලත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන කියද?

ඉ) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

**02. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා කුම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළද විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015-02-18 දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර/VI (1) /15/02)

අ) බස්නාහිර පළාතේ ඒ ඒ කලාප කාර්යාල වලට අනුව 6,7,8,9,10 හා 11 ශ්‍රේණිවල ලිවීම හා කියවීමට නොහැකි ශිෂ්‍යයින් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ආ) වාර්තාවට අනුව ලිවීමට හා කියවීමට නොහැකි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ) මෙම ශ්‍රේණි පරාසයන්හි පසුගිය වසර 5 තුළ පාසල් එම අතරමග නැවතුන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ) ඒ කුමන පාසල් වලද? කුමන ශ්‍රේණිවලද?

**03. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,කර්මාන්ත,පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් 2015.02.18 දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර/VI (1) /15/03)

අ) කෘෂිකර්ම, කෘෂි සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර ඇමතිවරයා V - වන පළාත් සභා කාලය තුළ, විෂය භාර අමාත්‍යවරයා වශයෙන් [ගරු - උදය ගම්මන්පිල මැතිතුමා] තම ධුරයේ කටයුතු සඳහා විදේශගත වූ අවස්ථා ගණන කීයද?

ආ) විදේශ ගතවූ රට, කුමන දිනවලද? ඒ අනුව විදේශගතව සිටි දින ගණන කවරේද?

ඇ) එකී දිනයන්හි සහභාගී වූ වැඩසටහන් කවරේද?

ඈ) අමාත්‍යවරයා සමග විදේශ සංචාරය වෙනුවෙන් සහභාගී වූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ) ඒ ඒ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද?

ඊ) සංචාරයන් සඳහා වැයකළ මුළු මුදල කොපමණද?

උ) ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ) නොඑසේ නම් ඒ මන්ද?

**04.** ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI(1)/15/04)

(අ) මිගමුව අධ්‍යාපන කලාපය තුළ වර්ෂ 2009න් පසු වසා දමා ඇති පාසැල් ගණන කවරේද?

(ආ) එසේ වසා දමන ලද පාසල්වල නම් සහ වසා දමන අවස්ථාවේ එකී පාසල්වල සිටි සිසුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද?

(ඇ) 2015 වසරේදී වැසීමට නියත වෙනත් පාසැල් මිගමුව අධ්‍යාපන කලාපය තුළ පවතිද?

(ඈ) එසේ වැසීමට නියමිත පාසැල් මිගමුව අධ්‍යාපන කලාපය තුළ පවති නම් එකී පාසැල් වල නම් මොනවාද?

(ඉ) එසේ වැසීමට නියමිත පාසැල් පවතිනම් එකී පාසැල් වල නම් සහ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ඊ) ඉහත කී ලෙස පාසැල් වසා දැමීමට හේතුව කුමක්ද?

(උ) ඉහත කී ලෙස දැනට වසා දමා ඇති පාසැල් වල සිසුන් වෙනත් පාසැල් වලට ඇතුලත් කළේ නම් එසේ සිසුන් ඇතුලත් කළ නව පාසැල්වල නම් සහ ඇතුලත් කල සිසුන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද?

**05.** ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI(1)/15/05)

(අ) මිගමුව අධ්‍යාපන කලාපය තුළ බප/මිග/ආඩිඅම්බලම මහා විද්‍යාලයේ ඉදිකල මහින්දෝදය විද්‍යාගාරය පාරට පෙනෙන ආකාරයට ඉදිකිරීම සදහා පාසලේ පැවති ගොඩනැගිල්ලක් කඩා ඉවත් කල බව, ඔබතුමා දන්නේද?

(ආ) මිග/ආඩිඅම්බලම මහා විද්‍යාලයේ කඩා දමන ලද ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ආ පංති කාමර මේ වන විට පවත්වා ගෙන යාමට නිසි ස්ථානයක් නොමැතිව, සිසුන් අසරණ තත්වයට පත්ව ඇති බව ඔබතුමා දන්නේද?

(ඇ) එකී විද්‍යාලයේ කඩා දමන ලද ගොඩනැගිල්ලෙහි පවත්වා ගෙන ආ පංති පැවැත්වීම සදහා ඔබතුමා විසින් මේ වන විට වෙනත් ගොඩනැගිල්ලක් එම පාසැලට ලබා දීමට පියවර ගෙන තිබේද?

(ඈ) එකී මිග/ආඩිඅම්බලම විද්‍යාලයට කතෝලික ආගම උගන්වන ගුරුවරයෙක් පත් කරන්නේ කවදද?

(ඉ) ඉහත ගැටළු කුමන කාල පරිච්ඡේදයක් තුළ විසදා අවසන් කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01.** ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:

"නීති විද්‍යාලය මේ වන විට නීතියේ පාලනයෙන් තොරව අත්තනෝමතිකව තීන්දු ගන්නා ආයතනයක් බවට පත්වී ඇත මෙම ක්ෂේත්‍රයේ ඉහලම වගකීම් දරණ පුද්ගලයන් නීති ශිෂ්‍යයන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කරන තත්වයට පත්ව ඇත. ඒ සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට පැමිණිලි කරන්නට ආයතනයක් නැත අධිකරණයටද යා නොහැක.

මෙවැනි තත්වයක් තුල සියවසක් සපිරෙන නීති විද්‍යාලයේ අභිමානය ආරක්ෂා කර අනාගත පරපුරට පැවරීමේ වගකීම මේ රජයේ යුතුකමකි එම නිසා දැඩි අසාධාරණයට ලක්ව සිටින නීති විද්‍යාලයේ සිසුන්ට සාධාරණයක් ඉටු කරමින් ගරා වැටුන නීති විද්‍යාලය සම්බන්ධයෙන් පවත්නා අර්බුද කඩිනමින් විසඳිය යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි,"

(යෝ/VI (1) /14/08)

**02.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගේන් දෙමව්පියන්ගෙන් විවින් විට මුදල් අයකිරීම සිදුවේ පළමුවන ශ්‍රේණිය හයවන ශ්‍රේණිය සහ දෙළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුළත් කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මෙලෙස මුදල් එකතු කිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත එබැවින් බස්නාහිර පළාත තුළ පාසල් දරුවන්ගේ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/VI (1) /14/09)

X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.02.19 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.